# උතුරු හා නැගෙනහිර පළාත් කිනම් අවශ්‍යතාවකට ද?

සිංහල භාෂාවේ උතුරු නැගෙනහිර නමින් ව්‍යවහාරයක් නොපැවතුණද පසුගිය අවුරුදු විස්සක පමණ කාලයක එවැන්නක් ක්‍රමයෙන් තහවුරුවෙමින් පැවතුණි. ඉංගිරිසියෙන් නෝත් ඊස්ට් යන්න සිංහලයෙන් කියැවෙන්නේ ඊසාන ලෙස ය. එහෙත් පසුගිය කාලයෙහි උතුරු නැගෙනහිර නමින් ඇතැමුන්, විශේෂයෙන් ම දෙමළ ජාතිවාදීන්, හැඳින්වූයේ ඊසාන දිගක් නොවන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. උතුරු හා නැගෙනහිර පළාත්වලට පළාත් සභා දෙකක් වෙනුවට එක් පළාත් සභාවක් ස්ථාපිතකිරීමට ජේ ආර් ජයවර්ධන මහතා ඉන්දියාවේ බලපෑම් මත ගන්නා ලද තීරණයෙන් පසුව උතුරු නැගෙනහිර යන්න ඊනියා දේශපාලන විචාරකයන්ගේ ශබ්දකෝශයට ඇතුල්විය. මේ පඬියෝ තමන් කතාකරන්නේ නීත්‍යානුකූල නොවන ආයතනයක් ගැන බව නොදත්තෝ යැයි අපි කියමු ද? ඔවුන් ඒ ගැන කුමක් දැනසිටිය ද, මෙරට අධිකරණය විසින් දෙන ලද ඓතිහාසික තීන්දුවකට අනුව ඒ පළාත් දෙකට ම එක පළාත්සභාවක් පමණක් ස්ථාපිතකිරීමට නීතියෙන් ඉඩක් තිබී නොමැත. මෙරට අධිකරණය පසුගිය කාලයෙහි රටේ ස්වෛරීභාවය හා ව්‍යවස්ථාදායකය ඔස්සේ ජනතාවගේ පරමාධිපත්‍යය ආරක්ෂාකරන තීන්දු කිහිපයක් ම දී ඇති බව මතක් කළ යුතු ය.

පළාත් සිංහල පාලන ව්‍යුහයක කොටස් නො වී ය. සිංහල පාලන ව්‍යුහයෙහි තිබ්බේ රටවල්, දිසාවනි, කෝරළ, පත්තු ආදිය ය. ලංකාව පළාත්වලට බෙදීමට බ්‍රිතාන්‍යයන් කටයුතුකෙළේ ඊනියා කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවලින් පසුව ය. 1815 උඩරට ගිවිසුම යනුවෙන් හැඳින්වෙන සිංහල බ්‍රිතාන්‍ය ගිවිසුමට අනුව බ්‍රිතාන්‍යයෝ සිංහල නීතිය අනුව රටකරවීමට බැඳීසිටියහ. එහෙත් ඔවුහු 1817 දී ම ගිවිසුම කැඩූහ. එහි ප්‍රතිඵලයක් වූයේ සිංහලයන්ගේ ප්‍රථම නිදහස් අරගලය ය. ඉන්පසුව ද විටින් විට ගිවිසුම කැඩූ බ්‍රිතාන්‍යයෝ ඉන් මුළුමනින් ම මෙන් ගිවිසුමෙන් වෙන්වීම සඳහා කෝල්බෲක් කැමරන් කොමිසම පත්කළහ. එහි වාර්තාව අනුව කරන ලද ඊනියා ප්‍රතිසංස්කරණවල අරමුණ වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය, ඒ හා බැඳුණු බටහිර ක්‍රිස්තියානි නූතනත්වය, ධනපති ක්‍රමය ආදිය මෙරට ස්ථාපිතකිරීමට පියවරගැනීම ය. රට පළාත්වලට කැඩුණේ ඒ ක්‍රියාදාමයෙහි එක් පියවරක් ලෙස ය. බ්‍රිතාන්‍යයෝ 1840 දශකයේ දළදා වහන්සේ රැකබලාගැනීමෙන් සම්පූර්ණයෙන් ඉවත්වීමෙන් පසුව උඩරට ගිවිසුම මුළුමනින් ම කැඩූහ. 1848 සිංහලයන්ගේ දෙවැනි නිදහස් සටනට එය ද හේතුවක් විය. මෙරට මුල් නිදහස් සටන් දෙක ම 1815 ගිවිසුම කැඩීම හා සම්බන්ධව වීමෙන් අදාළ ගිවිසුමේ විශේෂ වගන්ති දෙක සිහලයන්ට කෙතරම් තදින් ම බලපාන්නට ඇත්දැයි තේරුම් ගත හැකි ය. එහෙත් බ්‍රිතාන්‍ය අධ්‍යාපනය ඔස්සේ අපි පසු කලෙක මෙරට තිබූ පාලන ව්‍යූහය මුළුමනින් ම කඩා බිඳ දමා බ්‍රිතාන්‍ය ක්‍රමයක් පැටවූ කෝල්බෲක් කැමරන් යෝජනා ඊනියා ප්‍රතිසංස්කරණ ලෙස දැකීමට පුරුදු වූයෙමු.

1833 දී රට වෙන්කරනු ලැබුයේ පළාත් පහකට ය. ඒ උතුරු, දකුණු, නැගෙනහිර, බටහිර හා මධ්‍යම පළාත් ලෙස හැඳින්විණි. එදා උතුරු පළාතට අනුරාධපුරය ද නැගෙනහිර පළාතට පොළොන්නරුව ද අයත්විය. මේ පළාත් බෙදීමේ දී රටේ ඉතිහාසය, භූගෝලය, සංස්කෘතිය, දේශගුණය, ස්වාභාවික සම්පත් ආදී කිසිවක් සැලකිල්ලට ගෙන නැති බව පැහැදිළි ය. බ්‍රිතාන්‍යයන්ට වැදගත්වූයේ ආණ්ඩුකාරයාගේ ඒ ඒ ප්‍රදේශවල නියෝජිතයන්ගේ පහසුව මිස අනෙකක් නො වෙයි. බ්‍රිතාන්‍යයන්ගේ අභිමතයට වෙන්කෙරුණු පළාත්පහ අද වන තුරු ද පැවතියේ නම් උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ නිජභූමි ලෙස හැඳින්වීමේ දී අනුරාධපුරය හා පොළොන්නරුව ද දෙමළ නිජභූමි වීමට තිබුණි. මේ පළාත් බෙදීම් කෙතරම් අභිමත ද යන්නත් රටේ ඇතැම් ප්‍රදේශ දෙමළ නිජභූමි ලෙස හැඳින්වීම කෙතරම් ඉතිහාස විරෝධී ද යන්නත් මේ කරුණින් ම පැහැදිළි වෙයි. කල්යෑමේ දී පළාත් පහ, හයක් බවටත් හය හතක් අටක් බවටත් අවසානයේ දී 1889 දී  නවයක් බවටත් පත්විණි. ඉන් පළාත් දෙකක් දෙමළ නිජභූමි ලෙස නම්කිරීමට ඓතිහාසික, භූගෝලීය හෝ වෙනත් පදනමක් නැත. බ්‍රිතාන්‍යයන්ගේ අභිමත බෙදීමක් මත ඇතිවුණු පළාත් ඓතිහාසික නිජභූමි බවට පත්වූයේ දික්සිත් මහතා ඉන්දියාවේ බලපුළුවන්කාරකම ජයවර්ධන මහතාට පෙන්වීමෙන් පසුව ය. අද ද නැගෙනහිර පළාතේ දෙමළ හා මුස්ලිම් ජනයාගේ පදිංචිය මුහුදු තීරයට පමණක් සීමා වී තිබීම මෙහි දී වැදගත් වෙයි.

© Prof. Nalin De Silva

බ්‍රිතාන්‍යයන්ගේ පළාත් ඔස්සේ ඉන්දියාව පළාත් සභා අප මත පැටවී ය. එපමණක් නො වෙයි. දික්සිත් මහතාගේ අවශ්‍යතාවෙන් ඉන් පළාත් දෙකකට ම ඇති කෙරුණේ එක් පළාත් සභාවකි. එලෙස උතුරු හා නැගෙනහිර පළාත්වලට එක් පලාත් සභාවක් පැටවීම නීත්‍යානුකූල නොවන බව බොහෝ දෙනෙක් දැනසිටියහ. ඒ වෙන්කරන ලෙස විවිධ අවස්ථාවල උද්ඝෝෂණය කෙරී ඇත. නීතියට අනුව නම් වෙන්කිරීමට එක් පළාත් සභාවක් නො තිබුණි. කළ යුතුව තිබුණේ, නීතියට එකඟ නොවූවක් නිවැරදිකිරීම ය. කෙසේ හෝ පසුගිය දා ජ වි පෙරමුණ අධිකරණය ඉදිරියට යෑමෙන් මේ නිවැරදිකිරීමට අද අවස්ථාව ලැබී ඇත. අද වන විට අවාසනාවකට මේ සම්බන්ධයෙන් කතාකෙරෙන්නේ නැගෙනහිර පළාතට පත්කරන ආණ්ඩුකාරවරයා කවරකු වියහැකි ද යන්න ගැන පමණක් ය. එහෙත් ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කළයුතු දේ අපමණ ය. අප තවදුරටත් පළාත් සභා නොව පළාත් ව්‍යුහය පවත්වාගෙන යා යුතු ද? බ්‍රිතාන්‍යයන්ගේ පළාත් හා ඉන්දියානුවන්ගේ පළාත් සභාවල අපට ඇති අදාළත්වය කුමක් ද? අද රටේ පරිපාලනය සිදුවන්නේ දිස්ත්‍රික්ක ව්‍යුහය පදනම්කර ගනිමිනි. මෙරට ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්වචනයකර හඳුන්වා දී ඇත්තේ දිස්ත්‍රික්ක මිස පළාත් නො වේ. දිස්ත්‍රික්කයක පරිපාලනය කච්චේරි මගින් දිසාපතිවරයකුගේ ප්‍රධානත්වයෙන් සිදුවෙයි. පරිපාලනය සඳහා දිස්ත්‍රික්ක ව්‍යුහය ප්‍රමාණවත්වෙයි. දිස්ත්‍රික්ක වුව ද බ්‍රිතාන්‍යයන්ගේ අභිමත නිර්මාණයකි. එහෙත් දිස්ත්‍රික්ක ප්‍රමාණයෙන් (වර්ගඵලයෙන්) කුඩා බැවින් ඉන් එතරම් බරපතල ප්‍රශ්න ඇති නො වෙයි. එහෙත් මනා පරිපාලන ව්‍යුහයක් සඳහා නම් පළාත් ව්‍යුහය පමණක් නොව දිස්ත්‍රික්ක ව්‍යුහය ද අහෝසිකර ඓතිහාසික, භූගෝලීය, දේශගුණික ආදී වශයෙන් සලකා බැලීමෙන් සකස්කෙරෙන පරිපාලන ව්‍යුහයක් ස්ථාපිතකිරීමට කාලය එළඹී ඇත.

ඒ කෙසේවෙතත් මේ ඓතිහාසික වැදගත් අධිකරණ තීන්දුව පිළිබඳ ව ඇතැම් දෙමළ පක්ෂ කියන්නේ කුමක් ද යන්න දැනගැනීම සුදුසු ය. මුස්ලිම් පක්ෂ මේ තීන්දුවට විරුද්ධබවක් නො පෙනෙයි. එහෙත් ඒ පක්ෂ නායකයෝ ප්‍රසිද්ධියේ ඒ බව නො කියති. තීන්දුවට කරුණා පාර්ශ්වය ද විරුද්ධවන බව පෙනෙන්නට නැත. මුස්ලිම් පක්ෂවලට මෙන් ම කරුණාට ද වැදගත්වන්නේ නැගෙනහිර පළාත උතුරු පළාතේ ආධිපත්‍යයෙන් ගලවාගැනීම ය. ඔවුන්ට එසේ කිරීමට පළාත් දෙක සඳහා වෙන වෙන ම පළාත් සභා තිබීම වැදගත් ය. පළාත් දෙක සඳහා එක පළාත්සභාවක් පමණක් ඇති වූ විට උතුරු පළාතේ දෙමළ පක්ෂවල බලපෑමට නැගෙනහිර පළාත යටවන බව පැහැදිළි ය. ඒ හේතුව නිසා ම ප්‍රධාන වශයෙන් ම උතුරු පළාත පදනම්කරගත් දෙමළ පක්ෂ අධිකරණ තීන්දුව සමග එකඟවනු ඇතැයි සිතිය නො හැකි ය.

උතුරු පළාත පදනම්කරගත් ඇතැම් පක්ෂ කියන කරන දෙයින් පැහැදිළි වන්නේ ඔවුන් මේ තීන්දුව තමන්ගේ වාසියට යොදාගැනීමට අදහස්කරන බව ය. උතුරු පළාත පදනම්කරගත් දෙමළ පක්ෂවලට හා කිසිම පළාතක් තබා ප්‍රාදේශීය සභාවක්වත් පදනම්කර නොගත් තමන් සුපිරි මාක්ස් - ට්‍රොට්ස්කිවාදීන් යැයි සිතා සිටින ඇතැමුන්ට අනුව අධිකරණ තීන්දුව දෙමළ අභිලාෂවලට පටහැණි වෙයි. මේ සුපිරි මාක්ස් - ට්‍රොට්ස්කිවාදීන් යැයි කියාගන්නවුන් පදනම්කරගන්නේ මුළු මහත් ලෝකය ම වුව ද ලෝකයේ කිසිවෙක් ඔවුන්ගේ ප්‍රතිපත්ති අධ්‍යයනය නො කරති. ඔවුන් කියන කරන දෙය කුමක් වුවත් උතුරු පළාත පදනම්කරගත් දෙමළ පක්ෂවල ආකල්පය සමස්ත දෙමළ ජාතිවාදී ප්‍රශ්නය සම්බන්ධයෙන් වැදගත් වෙයි. ඒ පක්ෂවලට අනුව වත්මන් පාර්ලිමේන්තුවෙන් හා ව්‍යවස්ථාවෙන් දෙමළ ජනයාගේ අභිලාෂ ඉටුනොවෙයි. ව්‍යවස්ථාව මෙන් ම පාර්ලිමේන්තුව ද සිංහල බහුතරයේ අවශ්‍යතාවන් සඳහා පමණක් යැයි ඔවුහු කියා සිටිති. දැන් ඔවුන් කියන්නේ අධිකරන තීන්දුව ද ඒ ව්‍යවස්ථාව මත හා ඒ පදනම්කරගෙන පාර්ලිමේන්තුවෙන් සම්මතකරගත් පණත් මත පදනම්වන බැවින් ඔවුන්ට එය අදාළ නොවන බව ය. අප අමතක නොකළ යුතු කරුණක් නම් 1972 ව්‍යවස්ථා සම්පාදනයට විරුද්ධව සුන්දරලිංගම් මහතා අධිකරණයට කරන ලද අයැදුම ප්‍රතික්ෂෙපවීමෙන් පසු මේ පක්ෂ අධිකරණය ද විවේචනයකර තිබෙන බව ය. දෙමළ ජාතිවාදී පක්ෂ, විශේෂයෙන් ම උතුරු පළාත පදනම්කරගත් පක්ෂ ක්‍රියා කරන්නේ මෙරට ස්වෛරීභාවයට විරුද්ධව ය. රාජ්‍ය නොවන සංවිධානවලට තම ආත්ම හා ජීවිත විකුණා ඇති බත්බැළයෝ ද (මොවුන් හා සන්සන්දනයකිරීමේ දී ශරීර විකුණන්නියන් ඇත්තේ ඉතා ඉහළ තලයක ය) මෙරට ස්වෛරීභාවයට විරුද්ධ වෙති. මේ සියල්ලන්ට ම අවශ්‍ය වන්නේ හැකිනම් සෝල්බරි ව්‍යවස්ථාවට, විශේෂයෙන් ම මෙරට අධිකරණය බාල්දුකර එංගලන්තයේ සාමි මන්ත්‍රණ සභා අධිකරණයට (ප්‍රිවි කවුන්සලයට) රට උගස්කළ එහි විසිනවවැනි වගන්තියට, ආපසු යෑම ය. දෙමළ ජනයාට වී ඇතැයි කියන ඊනියා අසාධාරණකම් ගැන අද දෙමළ ජාතිවාදී පක්ෂ එතරම් කතා නොකරයි. ඒ ගැන කතාකරන්නේ අර බත්බැළයන් හා බොරු ප්‍රබුද්ධයන් ය. දෙමළ පක්ෂ අද අවධාරණයකරන්නේ ඔවුන්ගේ අභිලාෂ පිළිබඳව ය. දෙමළ අභිලාෂය යනු අවසාන විග්‍රහයෙහි දී අන්කිසිවක් නොව මෙරට සිංහලත්වයට හිමි තැන අහෝසිකිරීම ය; සිංහල බහුතරය විවිධ උපක්‍රම මගින් සුළුතරයක්

© Prof. Nalin De Silva

බවට පත්කිරීම ය; බ්‍රිතාන්‍යයන්ගේ සිංහල විරෝධී යටත්විජිතවාදී ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයෑම ය. බ්‍රිතාන්‍යයන් ඇතිකළ උතුරු හා නැගෙනහිර පළාත්වලට එක් පළාත් සභාවක් පමණක් තිබිය යුතු යැයි උතුරු පළාත පදනම්කරගත් දෙමළ පක්ෂ කියන්නේ එමගින් ඒ පළාත් සිංහලයන්ට අහිමිකිරීමටත් ඒ පළාත්වල තම ආධිපත්‍යය පිහිටුවීමටත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva